# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2331/55 - 2023 මැයි මස 12 වැනි සිකුරාදා - 2023.05.12**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### බදුල්ල පළාත් මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කිරීම

ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ නව වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීමට 2022 අයවැය කථාවෙහි යෝජනා කර ඇත. ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීම ප්‍රකාශයට පත් කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි 21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය සංශෝධනය කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අංක 2324/12 හා 2023.03.20 දිනැති *ගැසට් පත්‍රය* නිකුත් කරන ලදී.

ප්‍රකාශයට පත්කරන ලද නව පීඨයේ සිසුන්ට සායනික පුහුණුව ලබාදීම සඳහා පහසුකම් සැලසීමට බදුල්ල පළාත් මහ රෝහල තෝරා ගෙන ඇත. ඒ අනුව, උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි පුහුණුව සඳහා අවශ්‍ය පහසුකම් සංවර්ධනයට බදුල්ල පළාත් මහ රෝහල වහාම ක්‍රියාත්මක වන පරිදි ශික්ෂණ රෝහලක් ලෙස උසස් කර නැවත වර්ගීකරණය කෙරේ.

මෙම රෝහල හා සම්බන්ධ අනෙකුත් තොරතුරු පහත සඳහන් කරමි.

| | | |
|---|---|---|
| 01 | ආයතනයේ නම | ශික්ෂණ රෝහල, බදුල්ල |
| 02 | විෂයය පථය | රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 03 | පරිපාලන දිස්ත්‍රික්කය | බදුල්ල |
| 04 | ඡන්ද කොට්ඨාසය | බදුල්ල |
| 05 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | බදුල්ල |
| 06 | ආසන්නතම පරිපාලන කාර්යාලය | ශික්ෂණ රෝහල, බදුල්ල |
| 07 | ආයතන භාර නිලධාරි | අධ්‍යක්ෂ |
| 08 | වාර්තා කළ යුතු නිලධාරියා | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| 09 | තැපැල් හා විදුලි ලිපි කාර්යාලය | බදුල්ල |

1A - G 39471 — 56 (2023/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | | |
|---|---|---|
| 10 | ආසන්නතම දුම්රිය ස්ථානය | බදුල්ල |
| 11 | පොලිස් ස්ථානය | බදුල්ල |

**එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,**
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2023 මැයි මස 11 වැනි දින,
අංක 385,
"සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

EOG 05 - 0084

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.